# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2287/30 - 2022 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ මුණිගොඩ හේවගේ හේමසිරි අයත් වන්නා වූ එක්සත් ජාතික නිදහස් පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වුද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා දේවමුණි අදිකාරම්ගේ සනත් චමින්ද නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, වන්නකුවත්ත වඩුගේ කාලින්ද ජයවීර ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරමින් දේවමුණි අදිකාරම්ගේ සනත් චමින්ද, වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**කාලින්ද ජයවීර ප්‍රනාන්දු,**
තේරීම්භාර නිලධාරී,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව.

2022 ජූලි මස 06 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කළුතර.

EOG 07 - 0037



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ උඩපළාත ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන උඩපළාත ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ උඩපළාත ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ දසනායක මුදියන්සේලාගේ චාමික රුවන් දසනායක අයත් වන්නා වූ එකමුතු ප්‍රගතිශීලී සංධානය (වර්තමානයේ ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ) නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වුද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම උඩපළාත ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මුත්තුරාජ් ජෙයසංඛර් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

උඩපළාත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, හේවාගේ ධනුෂ්ක නලීන් සම්පත් ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරමින් මුත්තුරාජ් ජෙයසංඛර්, උඩපළාත ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ආචාර්ය එච්. ඩී. එන්. සම්පත් ප්‍රනාන්දු,**
තේරීම්භාර නිලධාරී,
උඩපළාත ප්‍රාදේශීය සභාව.

2022 ජූලි මස 06 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

EOG 07 - 0038

---

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසිවීම හේතුකොට ගෙන දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ කුලතුංග මුදියන්සේලාගේ දමිත් රුක්ෂාන් කුලතුංග අයත් වන්නා වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වුද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වේලාහෙට්ටිගේ ඉන්දික කුමාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, පියුමි ආටිගල වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරමින් වේලාහෙට්ටිගේ ඉන්දික කුමාර, දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**පියුමි ආටිගල,**
තේරීම්භාර නිලධාරී,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

2022 ජූලි මස 06 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පොළොන්නරුව.

EOG 07 - 0039

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.